# ලංසු කැඳවීමේ ආරාධනාවයි

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දිවුලපිටිය

## ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ - අධිවේගී මහන මැෂින්, ඕවර්ලොක් මැෂින් සහ අනෙකුත් මහන උපකරණ වර්ග සැපයීම

**ලංසු අංකය :- 09/04/09-39/ප්‍ර.ශ/2026**

1. **ලංසු කැඳවීම** : දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ බෙදා හැරීම පිණිස ගුණාත්මක තත්ත්වයෙන් යුතු මැහුම් කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ වර්ග 15 ක් යටතේ අධිවේගී මහන මැෂින් 100ක්, ඕවර්ලොක් මැෂින් 59ක් ඇතුළු මැහුම් කර්මාන්තයට අදාළ උපකරණ අයිතම 184 ක් පමණ සැපයීම සඳහා සුදුසුකම්ලත් සහ ලියාදිංචි ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ. (සෑම මැෂින් වර්ගයකටම අදාළ නිශ්චිත ප්‍රමාණයන් සහ තාක්ෂණික පිරිවිතරයන් ලංසු ලේඛනයෙහි ඇතුළත් කර ඇත)

2. **ප්‍රසම්පාදන ක්‍රියාවලිය** : මෙම ප්‍රසම්පාදන කටයුත්ත ජාතික තරගකාරී ලංසු කැඳවීමේ (NCB) පටිපාටියට අනුකූලව සිදු කරනු ලබයි.

3. **ලංසු ලේඛන නිකුත් කිරීම** : මේ සඳහා වන ලංසු ලේඛන 2026.09.02 දින සිට 2026.09.16 දින දක්වා රජයේ වැඩකරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03. 00 දක්වා කාලය තුළ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් ලබාගත හැක.

4. **ලේඛන ගාස්තුව** : ආපසු නොගෙවනු ලබන ලංසු ලේඛන ගාස්තුවක් ලෙස රු. 3,500/- ක මුදලක් කාර්යාලයට ගෙවා මෙම ලංසු පත්‍රිකා ලබාගත යුතුය.

5. **ලංසු සුරැකුම (Bid Security)** : සෑම ලංසුවක් සමගම පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් රු. 239,875.01ක වටිනාකමකින් යුත් ලංසු සුරැකුමක් (බැංකු ඇපකරයක්) ප්‍රාදේශීය ලේකම්, දිවුලපිටිය යන තනතුරු නාමයට ඉදිරිපත් කළ යුතුය. එය 2027.01.01 දින දක්වා වලංගු විය යුතුය.

6. **ලංසු භාරගැනීම සහ විවෘත කිරීම** : සම්පූර්ණ කරන ලද ලංසු පත්‍ර (පිටපත් දෙකකින්) මුද්‍රා තැබූ කවරයක බහා එහි වම් පස ඉහළ කෙළවරේ "ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ අධිවේගී මහන මැෂින්, ඕවර්ලොක් මැෂින් සහ අනෙකුත් මහන උපකරණ වර්ග සැපයීම - ලංසු අංකය : 09/04/09-39/ප්‍ර.ශ/2026" ලෙස පැහැදිලිව සඳහන් කර 2026/09/17 දින ප.ව 2.00 ට පෙර දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ එදිනම ප.ව 2.15 ට ලංසු විවෘත කරනු ලැබේ.

**වැඩිදුර තොරතුරු සහ විමසීම් :**

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිවුලපිටිය.**

**දුරකථන අංකය : 031-2246325 / 031-2246389 ගිණුම් අංශය)**
**විද්‍යුත් තැපෑල : divulapitiya.financedivision@gmail.com**
**වෙබ් අඩවිය : www.divulapitiya.ds.gov.lk**

**2026.09.02**